# MANRECAP මාසික පුවත් නිවේදනය #18

| 2007 මැයි | #18 |
|---|---|

## 1. දැනට පාවිච්චියට ගන්නා දැන්වීම් පුවරු



පසුගිය මූල්‍ය වර්ෂය තුලදී මැන්රිකැප් ව්‍යාපෘතිය සියලුම ඉලක්ක ගම්මාන වල දැන්වීම් පුවරු සවිකරන ලදී. ඒ මගින් ව්‍යාපෘතිය සහ (ප්‍රජා මූලික සංවිධාන) ගැන සියලුම තොරතුරු ජනතාවට දැන ගැනීම පිණිසය.

2006 වර්ෂයේ පෙබරවාරි මාසයේදී ව්‍යාපෘතිය මගින් එහි ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵල ගනනය කිරීමේ දී ශාන්තිපුරම් ගමේ පවුල් 260 ක් පමණ ජීවත් වන අතර, එහි සමහරුන් පවසා සිටියේ මේ ව්‍යාපෘතිය ගැන හරියට තොරතුරු නොදන්නා බවයි. ඒ නිසා ව්‍යාපෘතිය ගැන දැඩි අවධානයක් දක්වූ නිසා ශාන්තිපුරම් ගම් වාසීන් සමග මේ ගැන සාකච්ඡා කොට දැන්වීම් පුවරු හතරක් සවි කිරිමට කටයුතු යොදන ලදී. දැන් මේ දැන්වීම් පුවරු ව්‍යාපෘති සම්බන්ධ තොරතුරු ගැන පමණක් නොව වෙනත් සංවිධාන වල තොරතුරුත් ගම්වාසීන්ට දැනුම් දීමට යොදාගෙන ඇත.

## 2. දිස්ත්‍රික් ග්‍රාමසංවර්ධන නිලධාරිනියගේ ඉලක්ක ගම්මාන නැරඹීම.



දිස්ත්‍රික් ග්‍රාමසංවර්ධන නිලධාරිනිය පසුගිය මැයි 11 වන දින මුදු නොගත් ප්‍රදේශවල ගම්මාන තුනක් පරික්ෂා කිරීමට සංචාරයක යෙදුනි. දිස්ත්‍රික්කය තුල ඇති සියලුම CBO සංවිධාන වල ක්‍රියාකාරීත්වයන් ගැන වගකීම පැවරෙනුයේ දිස්ත්‍රික් ග්‍රාම සංවර්ධන නිලධාරියාටය.

සේවා ගම, ගනේෂපුරම් සහ පලිආරු යන ගම්වල ඇති CBO සංවිධාන වල නායකයින් හමුවී සාකච්ඡා කරන ලදී. සාකච්ඡාවේදී ග්‍රාම සංවර්ධන සමිති සඳහාත් කාන්තා ග්‍රාමසංවර්ධන සමිති සඳහාත් අලුතෙන් සංශෝධනය කරන ලද ව්‍යවස්ථාව ගැන අවබෝධයක් ලබා දෙන ලදී. ඒවාගේම CBO සංවිධාන කෙසේ පාවිච්චියට ගත යුතු දැයි සාකච්ඡා කරන ලදී.

ඇගේ නිල සංචාරය විශේෂයෙන්ම අනාරක්ෂිත ප්‍රදේශයේ ප්‍රජා සංවිධාන හමුවී කල සාකච්ඡාවක් නිසාත් ව්‍යාපෘතියේ නිලධාරීන් හමුවීම නිසාත් ගම්වාසීන්ට එය ඉමහත් ධෛර්යට කරුණක් විය. හේතුව විශේෂයෙන්ම අනාරක්ෂිත ප්‍රදේශයට ඇවිදින් මේ පැමින සිදුවූ නිසාය.